

# ජනසංගණනයක් සිදු කිරීමට අදාළ දැනුම් දීමයි



ජපන් රජය විසින්, 2020 ඔක්තෝබර් 1 වන දින පදනම් කරගත් ජනසංගණනයක් පවත්වයි.

සැප්තැම්බර් මැද සිට, සමීක්ෂණ නිලධාරීන් ඔබේ නිවසට පැමිණ, සංගණන ලේඛන බෙදා හරිනු ඇත.

මෙම ජනසංගණනයේ ප්‍රතිඵල, විදේශිකයන් හට ජපානයේ ජීවත් වීම පහසු කරවීමට අවශ්‍ය නගර සංවර්ධනය වැනි පියවර සඳහා යොදා ගනී.

මෙම ජනසංගණනය අදාළ වන්නේ, ජපානයේ මාස තුනකට වඩා වැඩි කාලයක් ජීවත් වූ, එසේත් නැතහොත් ඉදිරියට මාස තුනකට වඩා වැඩි කාලයක් ජපානයේ ජීවත් වීමට තීරණය කෙරුණු අයයි. ඔබගේ ජාතිකත්වය මෙයට අදාළ නොවේ.

ඉහත සඳහන් අදාළ පුද්ගලයන්, මෙයට පිළිතුරු ලබා දීමට බැඳී සිටින බැවින්, කරුණාකර අනිවාර්යයෙන්ම පිළිතුරු සපයන්න.

පිළිතුරු වල අන්තර්ගතය, සංඛ්‍යාලේඛන ජනනය කිරීමට පමණක් භාවිතා කෙරෙන අතර, ආගමන විගමන පාලනය හෝ පොලිස් පරීක්ෂණ වැනි වෙනත් අරමුණු සඳහා භාවිතා නොවේ.

මෙම ජනසංගණනයේ දී, ඔබට අන්තර්ජාලය හරහා පිළිතුරු ලබා දිය හැක.
කරුණාකර ඔක්තෝබර් 7 වන බදාදා දිනට පෙර, කෙසේ හෝ අන්තර්ජාලය හරහා පිළිතුරු ලබා දෙන්න.
※ අන්තර්ජාලය හරහා පිළිතුරු සපයන විට, ජපන්, ඉංග්‍රීසි, චීන (සරල හා සාම්ප්‍රදායික), කොරියානු, වියට්නාම්, ස්පාඤ්ඤ සහ පෘතුගීසි යන භාෂාවලින් මෙම සේවාව ලබා ගත හැකි ය.

ඔක්තෝබර් 7 (බදාදා) වන විටත් ඔබෙන් පිළිතුරක් නොලැබුණේ නම්, පිළිතුරු සැපයීම සිහි කැඳවීමට සමීක්ෂණ නිලධාරීන් ඔබේ ස්ථානයට පැමිණෙනු ඇත.

මෙම ජනසංගණනයේ දී ඇතුළත් කෙරෙන කරුණු ඔබට නොතේරෙන්නේ නම් හෝ, ඔබේ සමීක්ෂණ ලේඛනය ලැබී නොමැති නම්, කරුණාකර ජනසංගණන ඇමතුම් මධ්‍යස්ථානයට දන්වන්න.

ජනසංගණනය 2020, පොදු වෙබ් අඩවිය
https://www.kokusei2020.go.jp/

මෙම සංගණනය පිළිබඳ සිංහල විස්තරයක් පහත දැක්වෙන QR කේතය සහ URL එක වෙතින් සැප්තැම්බර් 1 වන අඟහරුවාදා සිට ලබාගත හැකි ය.
https://www.kokusei2020.go.jp/household/language/sinhala.html

ජනසංගණන ඇමතුම් මධ්‍යස්ථානය : 0570−07−2020
සේවා කාලය : සැප්තැම්බර් 7 වන සඳුදා ~ ඔක්තෝබර් 31 වන සෙනසුරාදා දක්වා
විවෘත වේලාව : පෙ.ව. 8 ~ ප.ව. 9 දක්වා
※ දුරකථන ක්‍රියාකරු ජපන් භාෂාවෙන් ප්‍රතිචාර දක්වන නමුත්, විදේශීය භාෂාවලින් ද සේවාව ලබාගත හැකි ය.

国勢調査
2020

Statistics Bureau Ministry of Internal Affairs and Communications ○○○○○ Prefecture